+

# පැරණි ලක්දිව ජල කළමනාකරණය තුළ රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් වී තිබූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*අයි.එම්.එම්. මධූෂාන් [1], ඩබ්ලිව්.ජී.එම්. තිවංක [2]*

පුරාණ ලක්දිව ආර්ථික ප්‍රතිපත්තියේ ඉතා වැදගත් ස්ථානයක් ජල සම්පත් කළමනාකරණය කර ගැනීම සඳහා යොමුව ඇත. ලාංකේය ආර්ථිකය මුළුමනින් ම පාහේ කෘෂිකර්මාන්ත පදනම් කරගත් හෙයින් ආර්ථිකය ස්ථාවර ව පවත්වා ගැනීමට ජල කළමනාකරණය වැදගත් විය. එම නිසා ජලය අවශ්‍ය ප්‍රමාණයට ගබඩා කිරීමෙන් ගොවි බිම්වලට අවශ්‍ය ජලය සැපයීම සිදු කරන ලදී. එසේ ක්‍රමවත් කළමනාකරණයකින් යුක්තව ජලය සුරක්ෂිත කිරීමට ඉපැරණි රාජ්‍ය පාලකයන්ගේ ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීම මේ පර්යේෂණයේ ගැටලුව බවට පත්විය. සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් ලක්දිව රාජ්‍ය පාලකයන් ජලය කළමනාකරණය කරගත් ආකාරය පෙන්වා දීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. පර්යේෂණය සිදු කිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික මූලාශ්‍රය ප්‍රමුඛ වශයෙන් යොදා ගත් අතර මහාවංසය, දීපවංසය වැනි ප්‍රාථමික මූලාශ්‍රය ඒ අතර භාවිත කර ඇත. එමෙන් ම සෙල්ලිපි මූලාශ්‍රය ද යොදා ගෙන ඇත. අධ්‍යයන සීමාව වසයෙන් අනුරාධපුර හා පොළොන්නරු යුගයයන් තෝරා ගෙන පර්යේෂණ සිදු කර ඇත. ජල කළමනාකරණය කිරීමට අතීත පාලකයන් මහා වැව් නිර්මාණය කළ බවත් එම වැව් සඳහා දියුණු තාක්ෂණික ක්‍රම යොදාගෙන තිබූ බවත් මහාවංසයේ සඳහන් වී ඇත. එ අනුව ජලය එක් රැස් කර කළමනාකරණයකින් යුක්ත ව තබාගැනීමට හෙක්ටයාර 20125ක විශාල කලා වැවත් හෙක්ටයාර 2550ක විශාල මින්නේරිය වැවත් නිර්මාණය කර ඇත. වැව් බැම්ම, පිටවාන, සොරොව්ව වැනි තාක්ෂණික නිර්මාණ හරහා ද ජලය කළමනාකරණයකින් යුක්ත ව පවත්වා ගැනීමට උත්සාහ කර ඇති බවට හඳුනා ගත හැකි විය. එසේ ම ජලය සඳහා බදු අය කිරීමට ද රාජ්‍ය පාලකයන් ක්‍රියා කර ඇති බවට වසභ රජුගේ පෙරිමියන්කුලම ශිලා ලේඛනයෙන් තහවුරු වී ඇත. එහි දැක්වෙන්නේ 'දකපති' යනුවෙන් ජල බද්දක් අය කළ බව යි. එසේ ම ජලය කළමනාකරණය සම්බන්ධව නීති රීති පවත්වා ගැනීමට අතීත රාජ්‍ය පාලකයන් ක්‍රියාකර ඇති බව සමන්තපාසාදිකාව වැනි ග්‍රන්ථවල දැක්වේ. එහි සඳහන් වන්නේ යම් වැවකින් ජලය නියමිත කුඹුරට හැර වෙනත් කුඹුරකට හැරවිය නොහැකි බව ය. මුල්කාලීන බ්‍රාහ්මී ලිපිවල 'වචි හමික' යන පුද්ගලයකු ගැන සඳහන් වී ඇත. එනම්, ජල කළමනාකරණය කර වැව් පාලනය කිරීමට අයිතිය ලැබූ පුද්ගලයා බව සෙනරත් පරණවිතාන විසින් පෙන්වා දී ඇති අදහස් අනුව හඳුනාගැනිමට හැකි විය. අතීත ලක්දිව ජනයාට සිය දෛනික අවශ්‍යතා ඇතුළු බොහොමයක් ආර්ථික කටයුතු සඳහා ජලය ප්‍රමාණවත් පරිදි පවාත්වාගත හැකි වූයේ රාජ්‍ය පාලකයන් ක්‍රියා කළ ආකාරය හා ජනයා තුළ ඒ සඳහා පැවැති අනුගත භාවය නිසා බවත්, එය කළමනාකරණය කර ගැනිමෙන් ජලය ප්‍රමාණවත් වු බවත් මෙම පර්යේෂණය තුළින් නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පදඃ*** ලක්දිව, ජල කළමනාකරණය, පාලකයන්, වැව්, මූලාශ්‍රය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madushanmilinda9@gmail.com

[2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.